**බදුල්ල මහා නගර සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 16 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 දෙසැම්බර් 09 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභාව සතු ගොඩනැගිලි 13 ක, ඉඩම් කැබලි 50 ක හා මෝටර් රථ 08 ක වටිනාකම සමාලෝචිත වර්ෂය තුල තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප ආයෝජන ලෙස රු.282,186 ක් දැක්විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.193,920 ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් රු.88,266 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර සේවක ඇප තැන්පතු අඩුවෙන් සටහන් කිරීම හේතුවෙන් වගකීම් ද රු.88,266 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ලෙස රු.14,851,605 දැක්විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.14,867,246 ක් ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් රු.15,641 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ස්ථාවර තැන්පතු පොලිය රු.547,543 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, එය රු.404,931 ක් ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් රු.142,612 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලිය රු.1,412,884 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට රු.1,488,096 ක් බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.75,212 වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී ණයගැති ප්‍රතිපාදන සලසා තිබුණු ප්‍රමාණයට වඩා සමාලෝචිත වර්ෂය තුලදී මුද්දර ගාස්තු ආදායම් රු.6,247,803 ක් ලැබී තිබුණ ද රු.9,003,709 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.2,755,906 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.21,622,362 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.21,368,079 ක් ලෙස දැක්වීම නිසා ණයගැතියන් රු.254,283 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.4,759,701 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.4,757,547 ක් ලෙස දැක්වීම නිසා ණයගැතියන් රු.2,154 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.27,830,575 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.27,731,685 ක් ලෙස දැක්වීම නිසා ජංගම වගකීම් රු.98,890 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවන ලද ණය වාරිකවල එකතුව රු.2,653,679 ක් විය. එම ණය වාරිකවලින් පසුගිය වර්ෂයන්ට අදාල පොලී මුදල වන රු.1,996,635 ණයහිමියන්ටද, වාරිකවල ප්‍රාග්ධන අගය වන රු.223,706 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමටද, වර්ෂයට අදාල පොලිය වන රු.433,338 ආදායම් හා වියදම් ගිණුමටද හර විය යුතුය. එහෙත් මෙම මුළු මුදලම දේශීය ණය සංවර්ධන අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(ඔ) ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් හිඟ පොලී මුදල් ණය ගිණුමට එකතු කර තිබුණි. ඒ හේතුවෙන් ණය මුදල රු.25,486,785 කින් වැඩිවී තිබුණි. එම වෙනස ණයහිමියන් මඟින් ගැලපීම් කළ යුතු වුවද, සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කර තිබුණි. මේ හේතුවෙන් සමුච්චිත අරමුදල රු.27,991,099 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) ඉහත (ඒ සහ ඔ) ගැලපීම් සිදු කිරීමෙන් පසු දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.114,842,503 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.114,916,844 ලෙස දැක්වීම හේතුවෙන් ජංගම නොවන වගකීම් රු.74,341 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය පොලී වශයෙන් රු.5,081,776 ක් ණයහිමියන් යටතේ වෙන් කිරීමක් කර ඇත. එහෙත් 2014 ඔක්තෝබර් 27 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් සභාව වෙත ලබාදුන් ණය සඳහා හිඟ පොලියද ඇතුලත්ව නව ණය ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම හේතුවෙන් පොලී වෙන්කිරීමක් අවශ්‍ය නොවන බව දක්නට ලැබුණි. මේ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.5,081,776 කින් අඩුවී තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී රු.29,913,383 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 84,348,697 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.102,342,067 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

(අ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.59,332,353 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

------------------------------------

2015 ඔක්තෝබර් 09 දින වන විටද නිකුත් කරන ලද විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

-----------------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස් වරයාගේ 1980 දෙසැම්බර් 31දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | අවම වශයෙන් වසර 5 කට වරක් මාසික බදු කුලිය තක්සේරු කළ යුතු වුවද, භූමි ප්‍රමාණය වර්ග අඩි 1126 ක් වූ සේනානායකපිටිය කිරිහල බදුදීමේ දී බදු කුලිය තක්සේරු කරවා ගැනීමෙන් ගැනීමෙන් තොරව වසර 18 ක පමණ කාලයක සිට රු.5,000 ක් වන මාසික බදුකුලිය දිගින් දිගටම අයකරමින් පැවතුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්තිය | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා වැඩ තහනමට ලක්වූ සේවකයින් / නිලධාරීන් 26 දෙනෙකුගෙන් අයවිය යුතුව පවතින රු.1,580,510 ක සේවක ණය අය කර ගෙන නොතිබුණි. |

(ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු.251,766 ක් වටිනා චෙක්පත් 33 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර දෙකක කාලයක් ඉක්ම වූ රු.4,645,578 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371 | 1998 වර්ෂයේ සිට 2014 දක්වා කාලය තුල අවස්ථා 55 කදී විවිධ කාර්යයන් සඳහා විවිධ පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු.4,450,558 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 756 | 2014 වර්ෂයේ සභාවට අයත් වත්කම් හා භාණ්ඩ පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,781,222 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,712,779 ක් විය. ඒ අනුව රු.35,494,001 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **උසාවි දඩ මුදල්**

-----------------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2014 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 4,757,547 ක උසාවි දඩ මුදල් නගර සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.2 **මුද්දර ගාස්තු**

--------------

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත එවා ඇති නමුත් පළාත් භාණ්ඩාගාරයේ රඳවා ගන්නා ලද රු. 21,368,079 ක මුද්දර ගාස්තු සභාවට ලැබිය යුතුව තිබුණි.

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ගබඩා පාලනය
(ඉ) ලිපිගොනු නඩත්තුව